www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ගල්ෆ් තෙල් කාන්දුව හා සමාජවාදය සඳහා අවකාශය

## The Gulf oil spill and the case for socialism

2010 ජුනි 8

මෙක්සිකෝ මුහුදේ සිදුවෙමින් පවතින ව්‍යසනය සහ බ්‍රිටිෂ් පෙට්‍රෝලියම් සමාගම සම්බන්ධයෙන් එක්සත් ජනපද ආන්ඩුව දක්වන සාපරාධී නොතැකීම හා උදාසීනත්වය ධනේශ්වර පද්ධතියේ අයථාභාවයත් සමාජීය වසයෙන් විනාශකාරී ස්වභාවයත් වඩා සිත් කාවදින අයුරින් හෙලිදරව් කරයි.

මූල්‍ය අර්බුදයේ සහ වෝල් වීදියේ විෂ සහිත වත්කම් ප්‍රසාරනය වීමේ ප්‍රති විපාකවලින් ලෝකය සැලෙද්දී පවා, එම අර්බුදයන්ට හේතු වූ ලාභය සඳහා වන උමතු තල්ලුව ම පිලිබිඹු කරමින් බහුජාතික තෙල් අධිකාරය, නැගෙනහිර මුහුදු තීරය හරහා යුරෝපය දෙසට පවා ගලායාමට තර්ජනය කරන විෂ සහිත බොර තෙල් හා රසායනික ද්‍රව්‍ය නිරන්තරයෙන් කාන්දුවීමේ තත්වයක් නිර්මානය කොට තිබේ.

සමස්ත ජීවී විශේෂයන්ගේ පැවැත්මට තර්ජනය කරමින් සහ ධීවර කර්මාන්තයේ, සංචාරක ක්ෂේත්‍රයේ හා අනෙකුත් කර්මාන්තවල නියැලී සිටින කම්කරුවන් සියදහස් ගනනකගේ ජීවිකාවන් විනාශ කරමින් වටිනා තෙත් බිම් ද වෙරල තීරයන් ද හංග කරන මෙම ව්‍යසනයේ දීර්ඝකාලීන විපාක විද්‍යාඥයන් විසින් ගනන් බලමින් සිටිති.

කම්කරුවන් 11ක් ඝාතනය කරමින් ව්‍යසනය මුදාහල ගැඹුරු මුහුදේ සිදුවූ පිපිරීමෙන් සති 7කට හා මුහුදේ කාන්දුවන තෙල් ධාරාව වැලැක්වීමට දරන ලද ප්‍රයත්නයන් නැවත නැවතත් අසාර්ථක වීමෙන් පසුව ද බීපී සමාගම සහ ඔබාමා පරිපාලනය වැලැක්වීමේ නව ආවරනය සාර්ථක වී යයි කියා සිටිති. තෙල් ධාරාව ගලායාම හැකි ඉක්මනින් වලක්වනු ඇතැයි යමෙකුට හුදෙක් බලාපොරොත්තු තැබීම පමනක් කල හැකි අතර බීපී සමාගමේ සහ ආන්ඩුවේ වාර්තාව පෙන්නුම් කරන්නේ ඔවුන් ප්‍රකාශ කරන කිසිවක් මතුපිට අර්ථයෙන් නො ගත යුතු බවයි.

ඊට විපරීතව ආරම්භයේ පටන් ම බීපී විධායකයන්ගේ සහ ධවල මන්දිරයේ ප්‍රමුඛ උත්සුකය බවට පත්ව ඇත්තේ ව්‍යසනයේ පරිමාව මහජනයාගෙන් වසන් කිරීමත් සමාගමේ ආදායම් සහ ලාභ ආරක්ෂා කරගැනීමත් ය. පිපිරීමට පෙරාතුව ආරක්ෂක ක්‍රම හා පාරිසරික නීති උල්ලංඝනය කිරීම් නො තකා හැරීමේ අපරාධයට හවුල් වූ ස්වදේශ කටයුතු දෙපාර්තමේන්තුවේ ඛනිජ කලමනාකාර සේවය, පසුගිය සතියේ මුහුදට කොපමන තෙල් ප්‍රමානයක් ගලායමින් පැවතියේ ද යන්න සෙවීමට පත්කල ගවේෂන කන්ඩායමේ සොයාගැනීම් හිතාමතා ම වරදවා නිරූපනය කලේ ය.

ප්‍රවෘත්ති නිවේදනයක් නිකුත් කරමින් තක්සේරුගත පරාසය දිනකට තෙල් බැරල් 12,000ත් 19,000ත් අතර ප්‍රමානයක් යයි ආන්ඩුව ප්‍රකාශ කල ද විද්‍යාඥයන්ගේ නිගමනය වූයේ ඔවුන්ගේ "අවම සීමාව" අනුව දිනකට තෙල් බැරල් 12,000ත් 25,000ත් අතර ප්‍රමානයක් කාන්දු වෙමින් තිබුනු බව ය. උපරිම අගය තවමත් නිර්නය කල යුතුව පැවති බව විද්‍යාඥයන් කී අතර එය දිනකට බැරල් 25,000කට වඩා "සැලකිය යුතු ලෙස" වැඩි විය හැක.

ඔබාමා පරිපාලනය තෙල් කාන්දුවේ පරිමාව නිරන්තරයෙන් ලඝුකොට දක්වා ඇත්තේ හුදෙක් බීපී සමාගම සහ තමන්ගේ ම වගකීම ආවරනය කිරීමට පමනක් නො වේ. වඩාත් මූලිකව ගත්කල මූල්‍ය සමපේක්ෂකයන් විසින් නිර්මානය කරන ලද ව්‍යසනකාරී ආර්ථික අර්බුදය සහ අප්‍රේල් 5 දින බටහිර වර්ජිනියාහි අපර් බිග් බ්‍රාන්ච් පතලේ සිදු වූ පිපිරීමෙන් ආකර කම්කරුවන් 29ක් ඝාතනය වීම වැනි අනෙකුත් සිද්ධීන්වලින් ඉක්බිත්තේ වැඩෙන ව්‍යාපාර විරෝධී සහ ධනේශ්වර විරෝධී මනෝගතියක උෂ්නය ධවල මන්දිරයට දැනෙන්නට පටන් ගෙන තිබෙන අතර එය අපසරනය කිරීම ඔවුන්ගේ අරමුන වී තිබේ.

සති අන්ත ප්‍රවෘත්ති වැඩසටහන්වල දී තෙල් කාන්දුව කෙරෙහි පරිපාලනය පැත්තෙන් වගකීම දරන වෙරලාරක්ෂක අද්මිරාල් තඩ් ඇලන්, අගෝස්තු මාසයේ පිහිටාධාර ලිඳක් සම්පූර්න කිරීම සමගින් "අවසන් අලුත්වැඩියාවන්" ක්‍රියාත්මක කල පසු "කාන්දුවන තෙල් මාස ගනනක් එහි රැඳෙනු ඇති බවත් එය ගිම්හානය දක්වා අල්ලා සිටිනු ඇති" බවත් ප්‍රකාශ කරමින් යලි වතාවක් ව්‍යසනයේ පරිමාව ලඝුකොට දැක්වීය.

පසුගිය මාසයේ 30 දින ධවල මන්දිර සාකච්ඡාවක දී ඇලන්ට සිය තකතීරු ප්‍රකාශයෙන් පසුබැසීමට බලකෙරුනේ "මම ඔබත් සමග එකඟ වෙනවා. පරිසරය සහ පදිංචිකරුවන් කලින් තත්වයට ගෙනඒම වැනි දීර්ඝ කාලීන වැඩවලට අවුරුදු ගනනක් ගතවේවි" යනුවෙන් ප්‍රකාශ කරමිනි.

දූෂනය වී ඇති වෙරල තීරයේ සැතපුම් 140ක් පුරා තෙල් සහ මියගිය සතුන් පාවී යමින් තිබිය දී

ඔබාමා මෙසේ ප්‍රකාශ කරමින් ව්‍යසනයේ පරිමාව ලඝුකොට දැක්වීය. "මෙය ප්‍රකෘතිමය පාරිසරික පද්ධතියක්. මුහුදු තීරයේ ද ඉක්මනින් ප්‍රකෘති තත්වයට පත්වන මිනිසුන් සිටිනවා. මට අවස්ථාවක් ලැබුනා ඔවුන්ට කතා කරන්න. පසුගිය වසර 50-100 පුරා ඔවුන් මෙවැනි සිද්ධීන්ට මුහුන පා තිබෙනවා. ඔවුන් යලි පැරනි තත්වයට පත්වීමට නියමිතයි."

ජනාධිපතිවරයාගේ ස්වයං-තෘප්තිය හා නො තැකීම හුදෙක් පුද්ගලික ලක්ෂනයක් නො වේ. එය ලාභ ගරන පද්ධතියේ ගොදුරු බවට පත්වන වැඩකරන ජනතාව කෙරෙහි මහා ව්‍යාපාරිකයේ නියෝජිතයින් දක්වන සතුරු භාවය සහ පිලිකුල පිලිබිඹු කරයි.

ආර්ථිකය සංවිධානය කිරීමේ සහ සම්පත් බෙදාහැරීමේ වඩාත් ම කාර්යක්ෂම සහ තාර්කික ක්‍රමය "වෙලඳපොල" යයි කියමින් හොඳින් වැටුප් ලබන දේශපාලඥයන්, මාධ්‍යවේදීන් හා ශාස්ත්‍රාලිකයන් දීර්ඝකාලයක් පුරා ධනවාදය ආරක්ෂා කොට ඇත. එහෙත් බීපී ව්‍යසනය, ධනවාදයේ පවතින අරාජකත්වයේ සහ සැලැස්මක් නොමැති කමේ ද එමගින් මානව ජීවිතය පෞද්ගලික ලාභයට යටත් කිරීමේ ද කුරිරු විපාක ලොවට හෙලිදරවු කොට ඇත.

ධවල මන්දිරයේ සිය රිපබ්ලිකානු පූර්වගාමියා මෙන්ම ඔබාමා ද අනන්‍ය වී ඇත්තේ මෙම ව්‍යසනයේ ගොදුරු බවට පත්වූවන්ගේ ඉරනම සමග නොව එයට වගකිව යුතු ව්‍යාපාර අපරාධකාරයින් සමග ය. "දැන් පවතින තෙල් කැනීම් සාමාන්‍යයෙන් කාන්දුවීම් ඇති කරන්නේ නැහැ. ඒවා තාක්ෂනිකව ඉතා උසස්" යයි උතුරු කැරොලිනාහි ශ්‍රාවකයකට කියමින් ගැඹුරු මුහුදේ සිදුවූ පුපුරායාමට සති තුනකටත් අඩු කාලයකට පෙර ඔබාමා වෙරලබඩ තෙල් කැනීම ප්‍රසාරනය කිරීම පිලිබඳ සිය සැලැස්ම උත්කර්ෂයෙන් ඉදිරියට දැමීය.

බීපී ප්‍රධාන විධායක නිලධාරී ටෝනි හේවර්ඩ් "අඩුලාභ අවදානම" යනුවෙන් නම්කල මුහුදු පෘෂ්ටයට සැතපුමකට යටින් සිදුවන තෙල් කාන්දු වීමකට බීපී සහ අනෙකුත් තෙල් සමාගම් සිටියේ මුලුමනින් ම නුසූදානම්ව ය. වෝල් වීදියේ බැංකු මෙන් ම මහා තෙල් සමාගම් ද ක්‍රියාත්මක වන්නේ දීර්ඝකාලීන සහ සමාජීය වසයෙන් අවශ්‍ය කෙරෙන පෘථිවි ගෝලය ආරක්ෂා කරගැනීම වැනි දේ සැලකිල්ලට ගෙන නො වේ. ඔවුන්ගේ ප්‍රමුඛ උත්සුකය වන්නේ සිය කොටස් හිමියන්ට විශාල හා ක්ෂනික කාර්තු ප්‍රතිලාභ හා ලාභ පිරිනැමීම යි. එලඹීමට නියමිත ව්‍යසනයක් පිලිබඳ අනතුරු ඇඟවීම් නො තකා හරිමින් ගැඹුරු මුහුදේ මෙහෙයුමක් කඩිමුඩියේ අවසන් කොට ඊලඟ ඩොලර් බිලියන ගනනක් වටිනා ක්ෂේත්‍රයට යාමට බීපී සමාගම දැක්වූ තදියම කෙනෙකුට විස්තර කල හැක්කේ අන් කෙසේ ද?

ව්‍යසනය මධ්‍යයේ පවා සමාගමේ කේන්ද්‍රීය අපේක්ෂාව වී ඇත්තේ එහි කොටස් මිල නො වැටී තබාගැනීම ය. පසුගිය සතියේ පසුභාගයේ එහි සභාපති කාල්-හෙන්රික් ස්වැන්බර්ග් සමාගමේ විධායකයින් "අපේ කොටස් හිමියන්ගේ ලාභාංශවල වැදගත් කම ගැන හොඳින් දැනුවත්" යයි ප්‍රකාශ කිරීමෙන් පසුව සඳුදා උදෑසන බීපී සමාගමේ කොටස් මිල සියයට 2.7කින් නැගුනි.

වඩාත් ම තාර්කික සහ අත්‍යවශ්‍ය ප්‍රතිචාරය විය යුත්තේ පසුගිය වසරේ ඩොලර් බිලියන 17ක ලාභයක් ඉපයූ බීපී සමාගමේ ලාභාංශ සහ සියලු නිෂ්පාදන සහ මූල්‍ය සම්පත් තෙල් ගලායාමේ විපාක සමග කාර්යක්ෂම ලෙස ගනුදෙනු කලහැකි වන පරිදි යොදවන ලෙසත්, ව්‍යසනයේ ගොදුරු බවට පත් අයට වන්දි ගෙවීමට යොදවන ලෙස නියෝග කිරීම යි.

එහෙත් ඔබාමා පරිපාලනය බීපී සමාගමේ පුද්ගලික දේපොල සහ ලාභ ස්ථිර ලෙස ආරක්ෂා කොට ඇත්තේ ඒවා පූජනීය සහ අනුල්ලංඝනීය ලෙස සලකමිනි. සඳුදා ධවල මන්දිර ප්‍රවෘත්ති සංවාදයේ දී අද්මිරාල් ඇලන් කියා සිටියේ ආන්ඩුවට බීපී සමාගම සමග "කටයුතු කිරීමේ දී සහයෝගීව හා සමාන්තරව වැඩ කිරීමට" සිදු වූ බවත් ඒ ගැඹුරු මුහුදේ කැනීමට ලක්වන ප්‍රදේශයේ හිමිකම "බීපී සමාගමට ඇති" බැවින් බවත් ය. මෙය බීපී සමාගම "නිෂ්පාදන බලවේගවල අයිතිය දරන" බැවින් ආන්ඩුවට බීපී සමාගම පසෙකට දැමිය නො හැකි යයි ඔහු මැයි 24 දා කල අදහස්වල ම තවත් ප්‍රකාශයකි.

ගැටලුව වන්නේ සිය ඒකායන අරමුන වූ ඉහල විධායකයන්ගේ සහ මහා කොටස් හිමියන්ගේ පුද්ගලික ධනය රැස්කිරීම මගින් මෙවැනි ව්‍යසනයක් නිර්මානය කල යෝධ සංගතයකට නිෂ්පාදන මාධ්‍යය පාලනය කිරීමට ඉඩ දෙන්නේ ඇයි ද යන්නයි. ඊට අමතරව ඉන්ධන සහ ස්වාභාවික ගෑස් වැනි ස්වාභාවික සම්පත් පුද්ගලික සමාගමකට "අයිති විය" යුත්තේ ඇයි? ඒ වෙනුවට බීපී සමාගමේ වත්කම් සමස්තයක් ලෙස සමාජයේ අවශ්‍යතා සඳහා බලෙන් අත්පත් කරගත යුතු අතර මෙම හදිසි තත්වයට මුහුන දීම සඳහා උපයෝගී කරගනු ලැබිය යුතු ය.

එහෙත් බැංකු මෙන් ම තෙල් කර්මාන්තය ද ජනසතු කිරීම, සෑම අංශයකින් ම සංගතවල අධිකාරය යටතේ පවතින ආන්ඩුවක්, ඩිමොක්‍රටික් හෝ රිපබ්ලිකන් යන කවරෙකුගේ නායකත්වය යටතේ වුවත් සිදු නොවනු ඇත. බලශක්ති අධිකාරයන් මහජන හිමිකාරීත්වය යටතේ පවතින උපයෝගීතාවන් බවට පරිවර්තනය කර ප්‍රජාතන්ත්‍රවාදී සැලසුම් කරනයක් සහිත සමාජවාදී ආර්ථිකයක් ස්ථාපනය කල හැක්කේ කම්කරු පන්තිය තමන් අතට දේශපාලන බලය ගතහොත් පමනි.

ජෙරී වයිට්

© www.wsws.org